# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை

# Annual Report

# 2023

## ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම

## இலங்கை காலநிலை நிதியம் (தனியார்) கம்பனி

## Sri Lanka Climate Fund (Private) Limited

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම
පරිසර අමාත්‍යාංශය
“සොබදම් පියස”
අංක 416/සී/1
රොබට් ගුණවර්ධන මාවත
බත්තරමුල්ල
ශ්‍රී ලංකාව

පටුන


1.අධ්‍යක්ෂ මණ්ඩලය ........................................................................................................ 1

1.1 කාර්ය මණ්ඩලය……................................................................................................ 2

2. හැඳින්වීම…................................................................................................................ 3

2.1 දැක්ම…................................................................................................................. 3

2.2 මෙහෙවර…............................................................................................................ 3

2.3 ආයතනික අරමුණු…................................................................................................ 3

3. ශ්‍රී ලංකා දේශගුණ අරමුදලේ දායකත්වය…........................................................................ 5

4. ආයතනික ගමන්මඟ…................................................................................................ 9

5. සේවාවන්…............................................................................................................... 10

5.1 හරිතාගාර වායු සත්‍යාපනය…................................................................................ 11

5.1.1 හරිතාගාර වායු සත්‍යාපන අංශයේ වාර්ෂික ප්‍රගතිය -2023…....................................12

5.2 ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය (SLCCS)…....................................................... 14

5.2.1 ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමයේ වාර්ෂික ප්‍රගතිය….........................................14

5.3 පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (CDM)…................................................................... 15

5.3.1 පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණයේ වාර්ෂික ප්‍රගතිය…...................................................15

5.4 ශුද්ධ ශුන්‍ය බලශක්ති සහතිකකරණය (Net Zero Energy)…......................................... 15

5.5 දේශගුණික ධනාත්මක සහතිකකරණය (Climate Positive Certification)….................. 16

5.6 පාරිසරික උපදේශන සේවාවන්…............................................................................. 17

5.7 ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය…............................................................................ 17

6. මූල්‍ය ප්‍රගතිය….......................................................................................................... 18

6.1 2023 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය…......................................................18

6.2 2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුල විස්තීර්ණ ආදායම් ප්‍රකාශය…........ 20

6.3 2023 දෙසැම්බර් මස 31 දිනට හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය…......................................... 21

6.4 2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය…............... 22

6.5 2023 දෙසැම්බර් මස 31 මූල්‍ය ප්‍රකාශන සඳහා සවිස්තරාත්මක සටහන …....................... 23

7. විගණකාධිපති වාර්තාව…........................................................................................... 29

# 01. අධ්‍යක්ෂ මණ්ඩලය

## සභාපතිගේ සමාලෝචනය



2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයට අදාලව ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාවට සමාලෝචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳ ඉමහත් සතුටට පත් වන අතර යතෝක්ථ වර්ෂයට අදාලව ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් ක්‍රියාවට නංවනු ලැබූ වැඩසටහන් සහ ව්‍යාපෘතීන් පිළිබද දළ විශ්ලේෂණයක් මෙන්ම උපායමාර්ගික උපදෙස් ක්‍රියාත්මක කිරීමේ නවතම තත්ත්වය පිළිබඳ යාවත්කාලීන කිරීම මෙම වාර්තාවේ ප්‍රධාන අරමුණයි.
තිරසර පරිසරයක් අරමුණු කරගනිමින් එය සාක්ෂාත් කර ගැනීම උදෙසා ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් ව්‍යාපෘතීන් සහ උපදේශන සේවාවන් රැසක් ක්‍රියාවට නංවා ඇති අතර ඒ හා සමගාමීව රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා ISO 14064 – 1:2018 හා **ISO** 14067:2018 යනාදී අනුකූලතා සහතිකපත් පිරිනැමීම ද ආයතනය සතු වගකීමක් වේ. මෙම සහතිකපත් නිකුත් කරනු ලබන්නේ අදාළ ආයතන විසින් ගණනය කරනු ලබන හරිතාගාර වායු විමෝචනය අප ආයතනය විසින් සත්‍යාපනය කිරීමෙන් අනතුරුවයි.
"ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය" පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස අංශයේ සෘජු අධීක්ෂණය සහ පරිපාලනය යටතේ ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන හරිතාගාර වායු වැඩසටහනකි. මෙම යෝජනා ක්‍රමය හරිතාගාර වායු විමෝචනය අවම කිරීමෙන් මූල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම උදෙසා 2016 වසරේදී පිහිටුවන ලදී.
ශ්‍රී ලංකාව පරිසර සුරක්ෂිතතාවයෙන් අනූන රටක් බවට පත් කිරීමට සහ සේවාදායකයා වෙත ගුණාත්මකභාවයෙන් ඉහල සේවාවක් ලබා දීමට ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් දරන උත්සාහය සහ කැපවීම පිළිබඳව අපි නිහතමානීව ආඩම්බර වෙමු.
සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් සහ වැඩසටහන් වලදී සේවා දාමය අඛණ්ඩව මෙන්ම ප්‍රශස්ථව පවත්වා ගැනීමටත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කාර්යක්ෂමව සහ ගුණාත්මකව ක්‍රියාත්මක කිරීමටත් සමාගම විසින් දරන ප්‍රයත්නය අගය කළ යුතු වේ.
ශ්‍රී ලංකාව තිරසර ආර්ථික සංවර්ධිත රටක් කරා යන ගමනේ දී එම අරමුණ සාක්ෂාත් කර ගැනීමට දායකවෙමින් දීර්ඝකාලීන පැවැත්මක් ඔස්සේ ඉදිරියට යාමට හැකිවේ යැයි අප ශුභවාදී විශ්වාසයකින් පසුවෙමු. ඉදිරියේ දී මුහුණ දීමට සිදුවන නොයෙක් අභියෝග හා ගැටලු හමුවේ නොපසුබට උත්සාහයෙන් සහ කැපවීමෙන් ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම ලාභදායී රාජ්‍ය සමාගමක් බවට පත් කිරීමට අප සතු සුදුසුකම්ලත් මානව ප්‍රාග්ධනය බෙහෙවින් පිටිවහලක් වනු ඇති බව මාගේ විශ්වාසයයි.







**ආචාර්ය**
**බී.එම්.එස්.බටගොඩ**
**ක්ෂේත්‍ර විශේෂඥ**

**වෙනුර ප්‍රනාන්දු මයා**
**සභාපති,**
**මධ්‍යම පරිසර අධිකාරිය**

**එන්.ටී. අමරතුංග මිය**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ,**
**මුදල් අමාත්‍යාංශය**

## 1.1 කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම සභාපති, ප්‍රධාන විධායක නිලධාරි ,තාක්ෂණික සහ තාක්ෂණික නොවන නිලධාරීගෙන් සමන්විත වේ. තාක්ෂණික කණ්ඩායම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) විසින් ලබා දී ඇති නිපුණතා අවශ්‍යතා (ISO 14066) සාර්ථකව සපුරා ඇත.

# 02. හැඳින්වීම

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම 2008 අප්‍රේල් 09 වන දින සමාගම් අංක පී වී 63781 යටතේ 2007 අංක 07 දරන සමාගම් පනතින් පිහිටුවන ලද රජය සතු සමාගමක් වන අතර 2020 සැප්තැම්බර් 25 වන දින ගැසට් වන ලද අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පරිසර අමාත්‍යාංශ විෂය පථය යටතට ඇතුලත් කර ඇත. සමාගම මගින් රාජ්‍ය හා පෞද්ගලික අංශයන් සඳහා තිරසාර පාරිසරිකත්ව ව්‍යාපෘතීන් රැසක් දේශීයව හා විදේශීයව ක්‍රියාත්මක කරනු ලබයි. ආරම්භයේ දී ශ්‍රී ලංකා කාබන් අරමුදල (පුද්ගලික) සමාගම යනුවෙන් හැඳින්වුවද**,** පසුව ආයතනය විසින් ඉටු කරනු ලබන විවිධ පාරිසරික ව්‍යාපෘතීන් සැලකිල්ලට ගෙන එම කාර්යභාරය තව දුරටත් පුළුල් කරගැනීම සඳහා 2016 ජනවාරි 29 වන දින සිට ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම ලෙස අප සමාගම් නාමය වෙනස් කරන ලදී.

සමාගමේ ප්‍රමුඛතම අරමුණ වන්නේ කාබන් විමෝචන සත්‍යාපනය තුළින් අඩු කාබන් ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා දායක වීමයි. තවද රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාබන් විමෝචන කාර්යසාධනය ප්‍රශස්ථ කරලීමට මඟපෙන්වීම ද සිදු කරනු ලැබේ.

## 2.1 දැක්ම

කාබන් උදාසීන හා දේශගුණික ප්‍රත්‍යස්ථිතික නීල හරිත ආර්ථිකය.

## 2.2 මෙහෙවර

කාබන් අවම හා දේශගුණික ප්‍රත්‍යස්ථිතික නීල හරිත සංවර්ධනයක් සඳහා ශ්‍රී ලාංකිකයන්ට සහාය වීම.

## 2.3 ආයතනික අරමුණු

I. එක්සත් ජාතීන්ගේ දේශගුණ වෙනස්වීම පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC) සහ කියෝතෝ සම්මුතියෙහි (Kyoto Protocol) ඇතුළත් පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (Clean Development Mechanism –CDM) ඇතුළු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

II. පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණයට අදාළ ව්‍යාපෘති සංවර්ධනය සඳහා පුද්ගලික රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානයන්ට උපදේශන සේවා සැපයීම, පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණට අදාළ ව්‍යාපෘති වලංගුකරණය (Validation) සහ සත්‍යාපනය (Verification) සඳහා පුද්ගලික සහ රාජ්‍ය ආයතනයන්ට පහසුකම් සැපයීම සහ හරිතාගාර වායු විමෝචනය අඩු කරන ව්‍යාපෘති සඳහා මූල්‍ය සම්පත් ලබා දීම.

III. පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය යටතේ සහතික කරන ලද හරිතාගාර වායු විමෝචන අඩු කිරීම (Certified Emission Reduction-CER) සහ ස්වෙච්ඡා යාන්ත්‍රණයක් (Voluntary Mechanism) මගින් සහතික කරන ලද හරිතාගාර වායු විමෝචන අඩු කිරීම් (Verified Emission Reduction) හා කාබන් වෙළෙඳාම.

IV. පාරිසරික තක්සේරුකරණය ඇතුළු පාරිසරික නිෂ්පාදන අලෙවිකරණ වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

V. ආයතනික ව්‍යාපෘති සහ නිෂ්පාදන මට්ටමේ හරිතාගාර වායු විමෝචන ප්‍රමාණීකරණය සහ සත්‍යාපනය සඳහා ක්‍රියා කිරීම.

VI. පරිසර තත්ත්ව වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාගාර සේවා සැපයීම.

VII. පාරිසරික සංචාරක කර්මාන්තය ඇතුළු පාරිසරික නිෂ්පාදන අලෙවිකරණ වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

VIII. ජෛව අපේක්ෂක වැඩසටහන් (Bio-prospecting programme) සංවර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

IX. සනීපාරක්ෂක කසළ බැහැර කිරීම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

X. වාණිජ වශයෙන් ශක්‍ය වෛද්‍ය සහ අන්තරායකර අපද්‍රව්‍ය දහනයන් සංවර්ධනය සහ පවත්වාගෙන යාම.

XI. ව්‍යාපෘති සංවර්ධකයින්ට අවශ්‍ය ඕනෑම සහාය සේවාවන් ලබා දීම.

XII. පාරිසරික නිෂ්පාදන සහ සේවා සංවර්ධකයින්ට සාධාරණ කොන්දේසි යටතේ මූල්‍ය සහාය ලබා දීම.

XIII. පාරිසරික සේවා සහ පරිසර දූෂණය වෙනුවෙන් භාවිත ගාස්තුවක් අය කිරීම සහ ලැබෙන මූල්‍ය ප්‍රතිලාභ ඔස්සේ තෝරා ගත් කර්මාන්තකරුවන්ට සහ ව්‍යාපාර සමූහයන්ට පාරිසරික සේවා සැපයීම.

XIV. හරිත වාර්තාකරණය (Green Reporting) ප්‍රවර්ධනය කිරීම උදෙසා පුද්ගලික සමාගම්වලට සහ නියෝජිතායතනයන්ට සහාය වීම.

XV. තිරසාර සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අරමුදල් ආයෝජනය කිරීම.

XVI. පරිසරයට සම්බන්ධ ඕනෑම ආකාරයේ පාරිසරික ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම.

XVII. ශ්‍රී ලංකාව හරිත ආර්ථිකයක් (Green Economy) කරා පරිවර්තනය කිරීමට අදාළ ඕනෑම කටයුත්තක් ක්‍රියාවට නැංවීම

## 03. ශ්‍රී ලංකා දේශගුණ අරමුදලේ දායකත්වය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමෙහි අරමුණ වන්නේ ව්‍යාපාරික ආර්ථිකයන්හි කාබන් අවම කිරීම සඳහා පහසුකම් සැපයීමයි. කාබන් අවම කිරීම සඳහා ගත හැකි විසඳුම්, ඵලදායි ලෙස වැඩි දියුණු කිරීමත්, නව්‍ය උපාය මාර්ග ගවේෂණය කිරීමත්, පවතින පහසුකම් තුල කාබන් විමෝචනය ප්‍රශස්ථ කිරීම සඳහා මඟ පෙන්වීමත් අප ආයතනය මඟින් සිදු කෙරේ. ඒ අනුව කර්මාන්තවල පාරිසරික පියසටහන අවම කරමින් එම ආයතන වල තිරසාර ව්‍යාපාරික භාවිතයන් වැඩි දියුණු කරගැනීමට සහ ව්‍යාපාර වල පාරිසරික ගුණාත්මකභාවය වැඩි දියුණු කරගැනීමටද පහසුකම් සපයනු ලබයි.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් ISO 14064 – 1:2018 හා ISO 14067:2018 යනාදී අනුකූලතා සහතිකපත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා පිරිනමනු ලබයි. ආයතන විසින් ගණනය කරනු ලබන හරිතාගාර වායුවිමෝචනය සමාගම මඟින් සත්‍යාපනය කිරීමෙන් අනතුරුව එම සහතික පත් පිරිනමනු ලබයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ඉහත සඳහන් සත්‍යාපන ක්‍රියාවලිය සඳහා සමාගමට අවසර ලබා දී ඇති අතර එය දේශිය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන්ද පිළිගැනීමට ලක් වේ. ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම දේශීය ව්‍යාපාර ආයතන සඳහා ගුණාත්මක සත්‍යාපන සේවා සැපයිමෙන් එම ආයතනවලට ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත යෑම පහසු වී ඇත. එමෙන්ම මෙම දායකත්වය තුලින් ගෝලීය දේශගුණ ක්‍රියාකාරකම් වලට එහි විනිවිදභාවය හා වගකීම් සහගත බව පෙන්නුම් කිරිමට ද අවස්ථාව උදාවී ඇත.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස අංශයේ සෘජු අධීක්ෂණය යටතේ පරිපාලනය කරනු ලබන ජාතික හරිතාගාර වායු වැඩසටහනක් ලෙස ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය සමාගම හරහා සිදු කරනු ලබයි. මෙම යෝජනා ක්‍රමය මඟින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සුදුසුකම් ලත් කාබන් කළමණාකරන ව්‍යාපෘති ලියාපදිංචි කරන අතර අපේක්ෂිත පාර්ශ්ව සඳහා ගුණාත්මක බව තහවුරු කළ ශ්‍රී ලාංකීය සහතික කරන ලද විමෝචන අඩුකිරීම් (SCER) නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය මඟින් කාබන් වෙළඳාමට පහසුකම් සැලසීමත්, ව්‍යාපාරවලට කාබන් ඉවත් කිරීමේ ව්‍යාපෘති සඳහා ආයෝජනය කළ හැකිවීමත් සහ එම විමෝචනය පියවා ගැනීමට වේදිකාවක් නිර්මාණය කිරිමත් සිදුකරයි. මෙය පාරිසරික වගකීම ප්‍රවර්ධනය කිරීමට අමතරව, තිරසාර අනාගතයකට ද දායකත්වය දැක්වීමක් ලෙසද පෙන්වා දිය හැක.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් ශ්‍රී ලංකාවේ හරිතාගාර වායුවිමෝචනය අවම කිරීම සඳහා පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය භාවිතා කිරීමට ආයෝජකයින් දිරිගැන්වීම හා පහසුකම් සැපයීම සිදුකරනු ලබයි. තවද ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් ව්‍යාපෘති සැලසුම් ලේඛනය (PDD),

අධීක්ෂණ වාර්තාව (MR) සකස් කිරීම සහ එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ (UNFCCC) පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රය (CMD) යටතේ ව්‍යාපෘති ලියාපදිංචි කිරීම සහ සහතික කරන ලද විමෝචන අඩුකිරීම් (CER) නිකුත් කිරීම සඳහා වලංගු කිරීම හා සත්‍යාපන ක්‍රියාවලියට පහසුකම් සපයයි. එමෙන්ම බලශක්ති විගණනය යටතේ ක්ෂේත්‍රයේ විශේෂඥයින් හා තාක්ෂණික උපකරණ මඟින් බලශක්ති විගණනයක් සිදුකර එය පරිසර හා සම්බන්ධ වන ආකාරය පැහැදිලි කර ඒ සඳහා එම ආයතන ගත යුතු ක්‍රියාමාර්ග යෝජනාකර ඒ සඳහා දිරි ගන්වගන්වනු ලබයි. කාබන් අවම ආර්ථිකයක් ගොඩනැගීම සඳහා තීරණ ගැනීමට අවශ්‍ය මඟපෙන්වීම හා නායකත්වය සැපයීමද, තවද ජාතික හරිත වාර්තාකරණ පද්ධතිය (GR) සඳහා උපදේශන සේවාවන් සැපයීමද ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම හරහා සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් විවිධ පාරිසරික හා දේශගුණික විපර්යාස සම්බන්ධ ව්‍යාපෘතීන් හා අරමුදල් කළමණාකරණය සිදුකරයි. ගෝලීය පරිසර පහසුකම් අරමුදලෙන් ක්‍රියාත්මක කරන ලද නූතන ජෛව බලශක්ති තාක්ෂණ ව්‍යාපෘතීන් ලෙස,

- හරිත ලංකා
- ජාතික අනුහුරුවීමේ සැලසුම
- අපේක්ෂිත ජාතික නිර්ණය කළ දායකත්වය හඳුන්වා දිය හැක.

ජාතික දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සඳහා වූ මඟ පෙන්වන්නෙකු  ලෙසද ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම කටයුතු කරනු ලබයි. එමෙන්ම සමස්ත ප්‍රජාවට දේශගුණික ක්‍රියාකාරීත්වයේ විවිධත්වය අවම කිරීමේ සිට අනුවර්තනය දක්වා සමාගමෙන් සපයනු ලබන සේවාවන් අතිවිශාලය. ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමේ ප්‍රධාන කාර්යභාරයක් ලෙස පාරිසරික විශිෂ්ටත්වය සඳහා වන ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂා ඉටුකර ගැනීම සඳහා එම සංවිධාන, ව්‍යාපාර සහ ව්‍යාපෘතිවලට සහාය දීම සිදු කරනු ලබයි. එමෙන්ම දේශගුණික අභියෝගවලට එරෙහිව ශ්‍රී ලංකා රජය සහ  පුද්ගලික අංශය විසින් ගෙන යනු ලබන වැඩපිළිවෙල සඳහා ද සහය දීමෙන් සුවිශේෂී කාර්යයක් ඉටු කරනු ලබයි.

2023 වර්ෂය සඳහා සමාගම විසින් හරිතාගාර වායු විමෝචනය අවම කරගැනීම සඳහා වෙළඳපොල කීර්තිමත් නාම දිනාගත් ආයතන සඳහා හරිතාගාර සත්‍යාපන සහතිකපත් බෙදාහැරීම් කරනු ලැබූ අවස්ථා කිහිපයක් පහතින් දක්වා ඇත.



ඇරින්මා හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම

**හරිතාගාර වායු සත්‍යාපනය**



හේලීස් ෆැබ්රික් පුද්ගලික සමාගම

**හරිතාගාර වායු සත්‍යාපනය**



හැටන් නැෂනල් බැංකුව
**හරිතාගාර වායු සත්‍යාපනය**




යුනිඩිල් පැකේජින්
**හරිතාගාර වායු සත්‍යාපනය**

# 04. ආයතනික ගමන්මඟ



## 05. සේවාවන්


හරිතාගාර වායු සත්‍යාපනය
(ISO 14064, ISO 14067)
ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය
පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය
ශුද්ධ ශුන්‍ය බලශක්ති (Net Zero Energy) සහතිකකරණය
දේශගුණික ධනාත්මක සහතිකකරණය
(Climate Positive Certification)
උපදේශන සේවාවන්
ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය
වෙනත් සේවාවන් (කාබන් උදාසීන සහතිකකරණය, වැඩසටහන් සත්‍යාපනය, ශුද්ධ ශුන්‍ය සහතිකකරණය)

තිරසර පරිසරයක් ගොඩනැගීම සඳහා සිදු කරනු ලබන ව්‍යාපෘතින් සත්‍යාපනය හා වලංගුකරණය මෙන්ම උපදේශන සේවාවන් සැපයීම සමාගමේ ප්‍රමුඛතම සේවාව වේ. ඒ අනුව සමාගම මඟින් සිදු කරනු ලබන ප්‍රධාන සේවාවන් ලෙස,

- හරිතාගාර වායු සත්‍යාපනය (ISO 14064 , ISO 14067)
- ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය (SLCCS)
- පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (CDM)
- ශුද්ධ ශුන්‍ය (Net Zero Energy) බලශක්ති සහතිකකරණනය
- දේශගුණික ධනාත්මක සහතිකකරණය (Climate Positive Certification)
- උපදේශන සේවාවන්
- ව්‍යාපෘති හා මුල්‍ය කළමනාකරණ ව්‍යාපෘතින් හඳුන්වාදිය හැකිය.

## 5.1 හරිතාගාර වායු සත්‍යාපනය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් ISO 14064-1:2018 හා ISO 14067:2018 යන අනුකූලතා සහතිකපත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා දේශීයව හා විදේශීයව පිරිනමනු ලබයි. එම ආයතන විසින් ගණනය කරන ලද හරිතාගාර වායු විමෝචනය සත්‍යාපනය කිරීමෙන් අනතුරුව එම සහතිකපත් පිරිනමනු ලබයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ඉහත සඳහන් සත්‍යාපන ක්‍රියාවලිය සඳහා සමාගමට අවසර ලබා දී ඇත. හරිතාගාර වායු විමෝචන ගණනය කිරිම වාර්ෂිකව සිදු කරනු ලබන අතර තෙවන පාර්ශීය සත්‍යාපනයක් තුලින් එම ආයතනික තොරතුරු සඳහා වටිනාකමක් ලබාදෙනු ලැබේ.

## 5.1.1 හරිතාගාර වායු සත්‍යාපන අංශයේ වාර්ෂික ප්‍රගතිය -2023

| අංකය | ව්‍යාපෘතිය | ප්‍රගතිය |
|---|---|---|
| හරිතාගාර වායු විමෝචන ප්‍රකාශනයේ සත්‍යාපනය ආයතනික මට්ටම | | |
| 01 | ලංකා දුම්කොළ සමාගම | සම්පූරණ කර ඇත |
| 02 | කොමර්ෂල් බැංකුව | සම්පූරණ කර ඇත |
| 03 | ඇල්පිටිය වැවිලි සමාගම | සම්පූරණ කර ඇත |
| 04 | නෝර්ලංකා පුද්ගලික සමාගම | සම්පූරණ කර ඇත |
| 05 | සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් සමාගම | සම්පූරණ කර ඇත |
| 06 | බෝඩිපැක් පුද්ගලික සමාගම | සම්පූරණ කර ඇත |
| 07 | ලංකා බැංකුව (2022) | සම්පූරණ කර ඇත |
| 08 | තලවකැලේ ටී එස්ටේට් | සම්පූරණ කර ඇත |
| 09 | කාගිල්ස් කොලිටි කන්ෆෙකෂනරීස් පුද්ගලික සමාගම | සම්පූරණ කර ඇත |
| 10 | ටෙක්ස්ට්‍රිප් පුද්ගලික සමාගම | සම්පූරණ කර ඇත |
| 11 | සිටිසන් ඩිවෙලොප්මන්ට් මූල්‍ය සමාගම | සම්පූරණ කර ඇත |
| 12 | කාර්ගිල්ස් ෆුඩ් කම්පැනි පී.එල්.සී. | සම්පූරණ කර ඇත |
| 13 | ඊ බී ක්‍රිසි ඇන්ඩ් කෝපරේෂන් | සම්පූරණ කර ඇත |
| 14 | සාලයික් පුද්ගලික සමාගම | සම්පූරණ කර ඇත |
| 15 | බොගවන්තලාව ටී එස්ටේට් | සම්පූරණ කර ඇත |
| 16 | හොරණ ප්ලාන්ටේෂන් පී එල් සී | සම්පූරණ කර ඇත |
| 17 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගම | සම්පූරණ කර ඇත |
| 18 | ඩිල්මා සිලෝන් ටී සමාගම | සම්පූරණ කර ඇත |
| 19 | මැලිබන් බිස්කට් සමාගම | සම්පූරණ කර ඇත |
| 20 | ජැෆර්ජී බදර්ස් සමාගම | සම්පූරණ කර ඇත |
| 21 | කොරියන් ස්පා ඇක්සසරීස් පුද්ගලික සමාගම | සම්පූරණ කර ඇත |
| 22 | නොරිටාකේ පෝසිලේන් පුද්ගලික සමාගම | සම්පූරණ කර ඇත |
| 23 | ග්ලෝබල් සී ෆුඩ් සමාගම | සම්පූරණ කර ඇත |
| 24 | ජාතික සංවර්ධන බැංකුව (2022) | සම්පූරණ කර ඇත |
| 25 | ඇමර්සන් ට්‍රේඩින් පුද්ගලික සමාගම | සම්පූරණ කර ඇත |
| 26 | රීසයිකල් ප්ලස් පුද්ගලික සමාගම | සම්පූරණ කර ඇත |
| 27 | ඇටයර් පුද්ගලික සමාගම | සම්පූරණ කර ඇත |
| 28 | MAS හෝල්ඩින්ස් – MAS කැපිටල් පුද්ගලික සමාගම | සම්පූරණ කර ඇත |

| | | |
|---|---|---|
| 29 | එම්ජේ ඉන්ටනැෂනල් පුද්ගලික සමාගම | 10% සම්පූරණ කර ඇත |
| 30 | MAS කැපිටල් පුද්ගලික සමාගම | 10% සම්පූරණ කර ඇත |
| 31 | ට්‍රිශෙල් ෆැබ්‍රික් පුද්ගලික සමාගම | 20% සම්පූරණ කර ඇත |
| 32 | ස්ට්‍රෙච්ලයින් පුද්ගලික සමාගම | 10% සම්පූරණ කර ඇත |
| 33 | කැලනි වැලි ප්ලාන්ටේෂන් පුද්ගලික සමාගම | 40% සම්පූරණ කර ඇත |
| 34 | යුනිඩිල් පැකේජින් පුද්ගලික සමාගම | 30% සම්පූරණ කර ඇත |
| 35 | කාර්ගිල්ස් කොලිටි ෆුඩ්ස් පුද්ගලික සමාගම | 10% සම්පූරණ කර ඇත |
| 36 | ඇතිමලේ ප්ලාන්ටේෂන් | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 37 | ලින්ක් නැචුරල් පුද්ගලික සමාගම | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 38 | සාලයික් - UK | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 39 | කොළඹ විශ්ව විද්‍යාලය | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 40 | ස්කැන්වෙල් ලොජිස්ටික් Colombo සමාගම | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 41 | ජාතික සංවර්ධන බැංකුව (2023) | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 42 | හැටන් නැෂනල් බැංකුව | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 43 | කොමර්ෂල් බැංකුව පී එල් සී | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 44 | ලංකා බැංකුව (2023) | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 45 | බෝඩ්පැක් පුද්ගලික සමාගම | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 46 | නේචර්ස් බියුටි ක්‍රියේෂන්ස් | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 47 | නොබෙල්ස්වෙයාර් පුද්ගලික සමාගම | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 48 | රිච්ලයිට් එක්ස්පෝට් පුද්ගලික සමාගම | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 49 | රේයින්බෝව් ෆැෂන්ස් | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 50 | LOLC හෝල්ඩින්ස් | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 51 | ලංකා IOC පුද්ගලික පී එල් සී | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 52 | ඩිප්ඩ් ප්‍රඩක්ට් පී එල් සී | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 53 | ලංකෙම් සිලෝන් පී එල් සී | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 54 | නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 55 | හෙඩ්ස්ටාට් පුද්ගලික සමාගම | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 56 | Siam සිටි සිමෙන්ට් ලංකා සමාගම - INSEE | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 57 | නගර සභාව - කුලියාපිටිය | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |
| 58 | ආනන්ද විද්‍යාලය - මරදාන | ගිවිසුම්ගත මට්ටමෙහි පැවතුනි |

## 5.2 ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය (SLCCS)

ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය යනු, ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස අංශයේ සෘජු අධීක්ෂණය යටතේ පරිපාලනය කරනු ලබන ජාතික හරිතාගාර වායු ව්‍යාපෘති වලංගුකරණය හා සත්‍යාපනය කිරිමේ වැඩසටහනයි. මෙම යෝජනා ක්‍රමය මඟින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සුදුසුකම් ලත් කාබන් කළමණාකරණ ව්‍යාපෘති ලියාපදිංචි කරනු ලබන අතර අපේක්ෂිත පාර්ශව සඳහා ගුණාත්මක බව තහවුරු කරන ලද ශ්‍රී ලාංකීය සහතික කරන ලද විමෝචන අඩු කිරීම් (SCER) නිකුත් කරනු ලබයි.

### 5.2.1 ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමයේ වාර්ෂික ප්‍රගතිය

| අංකය | ව්‍යාපෘතිය | ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමයේ වාර්ෂික ප්‍රගතිය | | |
| 01 | බෝගෝ පවර් පුද්ගලික සමාගම | සම්පූරණ කර ඇත |
| 02 | ඩිල්මා ටී සමාගම | සම්පූරණ කර ඇත |
| 03 | වේව්ලි පුද්ගලික සමාගම | සම්පූරණ කර ඇත |
| 04 | ලංකෙම් සිලෝන් පී එල් සී | සම්පූරණ කර ඇත |
| 05 | බොගවන්තලාව ටී එස්ටේට් | සම්පූරණ කර ඇත |
| 06 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | සම්පූරණ කර ඇත |
| 07 | හොරණ ප්ලාන්ටේෂන් පී එල් සී | සම්පූරණ කර ඇත |
| 08 | ඇනූනයින් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම | සම්පූරණ කර ඇත |
| ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමයේ සාකච්ඡා මට්ටමේ පැවතුණු ව්‍යාපෘති | | |
| 01 | තලවකැලේ ටී එස්ටේට් | සාකච්ඡා මට්ටමේ පවතී |
| 02 | පොතටුව තේ කර්මාන්ත ශාලාව | සාකච්ඡා මට්ටමේ පවතී |
| 03 | යුනිඩිල් ඇසුරුම් පුද්ගලික සමාගම | සාකච්ඡා මට්ටමේ පවතී |
| 04 | කේ ඩී ඊබර්ට් සහ පුත්‍රයෝ පුද්ගලික සමාගම | සාකච්ඡා මට්ටමේ පවතී |
| 05 | LOLC පුද්ගලික සමාගම | සාකච්ඡා මට්ටමේ පවතී |
| 06 | හේලීස් - සෝලා | සාකච්ඡා මට්ටමේ පවතී |
| 07 | ඩිප්ඩ් ප්‍රොඩක්ට් පී එල් සී | සාකච්ඡා මට්ටමේ පවතී |

## 5.3 පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (CDM)

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් ශ්‍රී ලංකාවේ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය භාවිතා කිරීමට ආයෝජකයින් දිරි ගැන්වීම හා පහසුකම් සැපයීම සිදු කරනු ලබයි.
එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ (UNFCCC) පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (CDM) යටතේ ව්‍යාපෘති ලියාපදිංචි කිරීම සහ සහතික කරන ලද විමෝචන අඩු කිරීම් (CER) නිකුත් කිරීම සඳහා වලංගු කිරීම හා සත්‍යාපන ක්‍රියාවලියට පහසුකම් සපයයි. තවද ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් ව්‍යාපෘති සැලසුම් ලේඛනය (PDD) හා අධීක්ෂණ වාර්තාව (MR) සකස් කිරීම සිදුකරනු ලබයි.

### 5.3.1 පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණයේ වාර්ෂික ප්‍රගතිය

| අංකය | ව්‍යාපෘතිය | ප්‍රගතිය |
|---|---|---|
| පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණයේ වාර්ෂික ප්‍රගතිය | | |
| 01 | සුළු පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය | එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC) වෙත අධීක්ෂණ වාර්තා (MR) ඉදිරිපත් කර ඇත. |
| 02 | බුලතාවත්ත ව්‍යාපෘතිය | |
| 03 | මස්කෙලිය ඔය ව්‍යාපෘතිය | |
| 04 | දඹුළු ඔය ව්‍යාපෘතිය | |
| 05 | මොරගහ ඔය ව්‍යාපෘතිය | |
| 06 | ගෝමලේ ඔය ව්‍යාපෘතිය | |

## 5.4 ශුද්ධ ශුන්‍ය බලශක්ති සහතිකකරණය (Net Zero Energy)

ශුද්ධ ශුන්‍ය බලශක්ති සංකල්පය යනු බලශක්ති භාවිතය මගින් බලශක්ති සංරක්ෂණ කාර්යක්ෂමතාව සහ එම ආයතනය මගින් සිදු කරනු ලබන පුනර්ජනනීය උත්පාදනය 100% සපුරා ගනු ලැබූ බලශක්ති භාවිතයයි. බලශක්ති සහතික කිරීමේ පද්ධතිය, කාබන් විමෝචනය අඩු කිරීම, බලශක්ති කාර්යක්ෂමතා තාක්ෂණය දිරිගැන්වීම හා ආයතනික මට්ටමෙන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් සංවර්ධනය කරන ලද සංකල්පයකි.
පුනර්ජනනීය නොවන බලශක්ති භාවිතය ඉක්මවන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන ව්‍යාපෘති ඇති ආයතන ශුද්ධ ශුන්‍ය බලශක්ති සහතිකකරණය සඳහා සුදුසුකම් ලබයි. මෙම සහතිකකරණයේ ප්‍රතිලාභ ලෙස,

- බලශක්ති භාවිතයෙන් ඇතිවන හරිතාගාර වායු විමෝචනය පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් අඩු කිරීමට හැකිවීම.

- ආයතනවලට,අයෝජකයන්ට සහ පාරිභෝගිකයන්ට පරිසර හිතකාමී ව්‍යාපාර වල නිරත වීමට අවස්ථාව ලැබීම.
- පුනර්ජනනීය බලශක්තිය උත්පාදනය කරන ආයතනවලට ඔවුන්ගේ අතිරික්ත බලශක්ති ප්‍රමාණය අලෙවිකර අමතර ආදායමක් උපයාගැනීමට අවස්ථාව ලැබීම.
- පුනර්ජනනීය බලශක්ති භාවිතය වැඩිදියුණු කිරීම තුලින් නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීමට හැකි වීම සහ එම ආයතනවලට දිගුකාලීනව තරඟකාරී වෙළඳපල තුල රැදී සිටීමට අවස්ථාව ලැබීම.
- පොසිල ඉන්ධන මත පදනම් වූ බලශක්ති, ඉතාමත් ඉක්මනින් වෙනස්වන මිල සහ සැපයුමක් සහිත වෙළඳපලක් ඇති බලශක්ති මත යැපීම අවම වීම.
- රට තුල සංවර්ධනය සඳහා තරඟකාරී හරිත පරිසරයක් නිර්මාණය වීම සහ දිගුකාලීන පුනර්ජනනීය බලශක්ති කර්මාන්ත ව්‍යාප්තිය ඉහළ යාම.

## 5.5 දේශගුණික ධනාත්මක සහතිකකරණය (Climate Positive Certification)

දේශගුණික ධනාත්මක සහතිකකරණය තුලින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමත්, සැලකිය යුතු විමෝචනය අවම කිරීම තුලින් දිගුකාලීන යහපැවැත්මක් ලඟාකර ගැනීමටත් මඟ පෙන්වීමක් මේ මගින් සිදු වේ. ආයතනයන්හි නිෂ්පාදන සහ සේවාවන්වල වාර්ෂික හරිතාගාර වායු විමෝචන සහතිකකරණය කිරීම මඟින් ඒවායෙහි හරිතාගාර වායු විමෝචනය පියවා ගැනීමට හැකියාව ලැබී ඇත. තවද දේශගුණික ධනාත්මක සහතිකය ලබා ගැනීම සඳහා ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල හරිතාගාර වායු විමෝචනය කෙරෙහි වාර්ෂිකව අවධානය යොමුකිරීම තුලින් ඔවුන්ගේ වාර්ෂික හරිතාගාර වායු විමෝචනය සහ එය සත්‍යාපනය කළ පසු අතිරික්ත ප්‍රමාණය අළෙවි කර ගැනීමට ද අවස්ථාව සැලසේ.

මෙම සහතිකකරණය සඳහා අවශ්‍ය ප්‍රධාන අනුකූලතා

- අපේක්ෂිත ප්‍රමාණාත්මක හරිතාගාර වායු විමෝචන සහතිකය (පිළිගත් තෙවන පාර්ශවයක් විසින් සත්‍යාපනය කරන ලද)
- අපේක්ෂිත පාර්ශවය විසින් කාබන් කලමනාකරණ ව්‍යාපෘති සංවර්ධනය කිරීම සහ ඔවුන්ගේ හරිතාගාර වායු විමෝචන අවම කරගත් පිළිගත් ජාතික හා අන්තර්ජාතික හරිතාගාර විමෝචන ව්‍යාපෘතිගතකරණය
- සහතිකකරණය කරන ලද ව්‍යාපෘති ස්වේච්ඡාවෙන් ක්‍රියාත්මක කල යුතු වීම
- අපේක්ෂිත පාර්ශවය ඔවුන්ගේ හරිතාගාර වායු විමෝචනය අතිරික්ත කාබන් ණය සමඟ හිලව් කිරීම කල යුතුය
- දේශගුණික ධනාත්මක සහතිකකරණයට අයත් ක්ෂේත්‍ර
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය

- නව වනවගා කිරීම හා නැවත වනවගාව
- බලශක්ති කාර්යක්ෂමතාවයන් හා සංරක්ෂණය
- නාස්තිය අවම කිරීම ,නැවත භාවිතයට ගැනිම සහ ප්‍රතිචක්‍රිකරණය

## 5.6 පාරිසරික උපදේශන සේවාවන්

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් කාබන් අවම ආර්ථිකයක් ගොඩනැගීම සඳහා ගනුදෙනුකරුවන්ට තීරණ ගැනීමට අවශ්‍ය මඟපෙන්වීම හා නායකත්වය උපදේශන සේවාවන් තුළින් සපයනු ලබයි. තවද ජාතික හරිත වාර්තාකරණ පද්ධතිය සඳහා ලියාපදිංචි වීමට ද උපදේශන සේවා සපයනු ලබයි.

## 5.7 ව්‍යාපෘති මුල්‍ය කළමනාකරණය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් විවිධ පාරිසරික හා දේශගුණික විපර්යාසය සම්බන්ධ ව්‍යාපෘතීන් හා ව්‍යාපෘතීන්ට අරමුදල් කළමණාකරණය සිදු කරනු ලබයි. එකී ව්‍යාපෘතීන් කිහිපයක් වන්නේ,

- ගෝලීය පරිසර පහසුකම් අරමුදලෙන් ක්‍රියාත්මක කරන ලද නූතන ජෛව බලශක්ති තාක්ෂණ ව්‍යාපෘතීන්
- හරිත ලංකා ව්‍යාපෘතිය
- ජාතික අනුහුරුවීමේ සැලසුම
- අපේක්ෂිත ජාතික නිර්ණය කළ දායකත්වය
- ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමේ විශේෂීකරණ ක්ෂේත්‍ර
- පුනර්ජනනීය බලශක්තීන්
- අනුවර්තනය හෝ අවම කිරීමට (Adaptation and Mitigation) අදාළ උපදෙස් ලබාදීම
- පාරිසරික ඉංජිනේරුකරණය
- MRV පද්ධති වැඩිදියුණු කිරීම
- ප්‍රජා සංවර්ධනය
- සමාජීය අධ්‍යනයන්

# 06. මූල්‍ය ප්‍රගතිය

## 6.1 2023 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| ශ්‍රී ලංකා දේශගුණික අරමුදල (පුද්ගලික)සමාගම | | | | |
|---|---|---|---|---|
| 2023 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය | | | | |
| | | 2023 | | 2022 |
| | සටහන් | රුපියල් | | රුපියල් |
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල පිරියත හා උපකරණ | 14 | 601,498.19 | | 843,242.19 |
| | | | | |
| | | | | |
| ස්ථාවර තැන්පතු | | | | |
| ස්ථාවර තැන්පතු | 9 | 10,000,000.00 | | 10,000,000.00 |
| | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| තිර රෙදි | | - | | - |
| කළින්ගෙවීම් | 15 | 25,129.26 | | - |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු වත්කම් | 8 | 17,827,274.44 | | 5,255,567.80 |
| මුදල් සහ මුදල් සමාන වත්කම් | 10 | 550,957.73 | | 198,459.66 |
| | | 18,403,361.43 | | 5,454,027.46 |
| | | | | |
| **මුළු වත්කම්** | | 29,004,859.62 | | 16,297,269.65 |
| | | | | |
| **හිමිකම් සහ වගකීම්** | | | | |
| **හිමිකම්** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 11 | 25,000,010.00 | | 25,000,010.00 |
| රඳවාගත් ලාභය/(අලාභය) | | 1,967,142.46 | | (11,619,371.38) |
| **හිමිකම් සහ වගකීම්** | | 26,967,152.46 | | 13,380,638.62 |
| | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| උපචිත ගෙවීම් | 12 | 2,037,707.40 | | 2,916,630.43 |
| | | | | |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 29,004,859.86 | | 16,297,269.65 |
| | | | | |

ඉහත සඳහන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර් කොටසක් වන පිටු මත දිස්වන මූල්‍ය ප්‍රකාශන සටහන් සමඟ ඒකාබද්ධව කියවිය යුතුය.
2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව මම සහතික කරමි.

| ............................................. | ............................................. | ............................................. |
|---|---|---|
| කළමනාකරු මානව සම්පත් හා මූල්‍ය | ප්‍රධාන විධායක නිලධාරී | සභාපති |

2007 අංක 07 දරන සමාගම් පනතට අනුව මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමක් සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

මණ්ඩලය වෙනුවෙන් සහ ඒ වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

| ............................................. | ............................................. |
|---|---|
| අධ්‍යක්ෂ | අධ්‍යක්ෂක |

## 6.2 2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුල විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| | | | | |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා දේශගුණික අරමුදල (පුද්ගලික) සමාගම | | | | |
| විස්තීරණ ආදායම් ප්‍රකාශය | | | | |
| 2023 දෙසැම්බර් 31 | | | | |
| | | | | |
| | | 2023 | | 2022 |
| | සටහන් | රුපියල් | | රුපියල් |
| ආදායම | 1 | 27,460,515.67 | | 14,030,203.36 |
| | | | | |
| **ව්‍යාපෘති අදාළ සෘජු වියදම්** | 2 | (4,143,208.08) | | (4,435,591.61) |
| | | | | |
| දළ ලාභය | | 23,317,307.59 | | 9,594,611.75 |
| | | | | |
| අනෙකුත් ආදායම් | 3 | 1,080,136.96 | | 832,397.26 |
| | | 24,397,444.55 | | 10,427,009.01 |
| **අඩු කිරීම්:** | | | | |
| | | | | |
| පෞද්ගලික පිරිවැය | 4 | 8,550,679.24 | | 6,529,800.86 |
| | | | | |
| පරිපාලන පිරිවැය | 5 | 2,342,513.01 | | 1,361,981.34 |
| | | | | |
| විකුණුම් සහ බෙදාහැරීමේ පිරිවැය | 6 | 9,350.00 | | - |
| | | | | |
| මූල්‍ය සහ අනෙකුත් වියදම් | 7 | 12,175.00 | | 5,155.00 |
| | | 10,914,717.25 | | 7,896,937.20 |
| | | | | |
| ලාභය/(අලාභය) බදු පෙර | | 13,482,727.30 | | 2,530,071.81 |
| | | | | |
| බදු | | | | - |
| | | | | |
| ලාභය/(අලාභය) බදු පසු | | 13,482,727.30 | | 2,530,071.81 |
| | | | | |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | | | | - |
| | | | | |
| මුළු විස්තීර්ණ ආදායම් | | 13,482,727.30 | | 2,530,071.81 |

6.3 2023 දෙසැම්බර් මස 31 දිනට හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය

| | සටහන | රඳවා ගැනීමේ ලාභය/ (අලාභය ) රුපියල් | ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් | එකතුව රුපියල් |
|---|---|---|---|---|
| | | | | |
| 2023 ජනවාරි 01 ආරම්භක ශේෂය | | (14,149,443.19) | 25,000,010.00 | 10,850,566.81 |
| | | | | |
| වර්ෂයේ ලාභය / (අලාභය ) | | 2,530,071.81 | | 2,530,071.81 |
| පෙර වසර ගැලපීම් | 13 | 107,780.54 | | 107,780.54 |
| පෙර වසර ගැලපීම් - ක්ෂය | | (3,994.00) | | (3,994.00) |
| | | | | |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය (අවසන් ශේෂය ) | | (11,515,584.84) | 25,000,010.00 | 13,484,425.16 |
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | | (11,515,584.84) | 25,000,010.00 | 13,484,425.16 |
| | | | | |
| වාර්ෂික ලාභය / (අලාභය ) | 13 | 13,482,727.30 | | 13,482,727.30 |
| | | | | |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | | 1,967,142.46 | 25,000,010.00 | 26,967,152.46 |

6.4 2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| ශ්‍රී ලංකා දේශගුණික අරමුදල (පුද්ගලික) සමාගම | | |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | | |
| 2023 දෙසැම්බර් 31 | | |
| | | |
| | 2023 | 2022 |
| | රුපියල් | රුපියල් |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය - මෙහෙයුම් ක්‍රියාකාරකම් | | |
| බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය/(අලාභය) | 13,482,727.30 | 2,530,071.81 |
| | | |
| ගැලපුම් | | |
| ක්ෂය වීම | 237,750.00 | 80,414.06 |
| පෙර වසර ගැලපුම් | 107,780.54 | 0 |
| | 13,828,257.84 | 2,610,485.87 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම් | | |
| වැඩි කිරීම් /(අඩු කිරීම්) සහ ලැබිය යුතු වෙනත් | (12,571,707.64) | (1,519,441.30) |
| (වැඩි කිරීම්)/ (අඩු කිරීම්) අරමුදල් කළමනාකරණ | (25,129.26) | |
| (වැඩිවීම්)/ (අඩු කිරීම්) අනෙකුත් ගෙවිය යුතු දෑ | (878,923.03) | (120,534.18) |
| | (13,475,759.93) | (1,639,975.48) |
| | | |
| ශුද්ධ මුදල් ප්‍රවාහය - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් | 352,498.07 | 970,510.39 |
| | | |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය - ආයෝජන ක්‍රියාකාරකම් | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | - | (826,000.00) |
| ශුද්ධ මුදල් ප්‍රවාහය - ආයෝජන ක්‍රියාකාරකම් | - | (826,000.00) |
| | | |
| | | |
| වැඩි වීම් / (අඩු වීම්) මුදල් සහ මුදල් සමාන දෑ | 352,498.07 | 144,510.39 |
| | | |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 198,459.66 | 53,949.27 |
| | | |
| වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ | 550,957.73 | 198,459.66 |
| | | |

## 6.5 2023 දෙසැම්බර් මස 31 මූල්‍ය ප්‍රකාශන සඳහා සවිස්තරාත්මක සටහන

| | | | | |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම | | | | |
| 2021 දෙසැම්බර් 31 | | | | |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සවිස්තරාත්මක සටහන් | | | | |
| | | 2023 | | 2022 |
| | | රුපියල් | | **රුපියල්** |
| **1** | **<u>ආදායම</u>** | | | |
| | හරිතාගාර වායු සත්‍යාපනය අදායම | 13,944,976.75 | | 10,295,212.95 |
| | පුහුණු සහ වැඩමුළු ආදායම | - | | 495,080.00 |
| | ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය ව්‍යාපෘති ආදායම | 2,243,797.50 | | 2,262,990.41 |
| | උපදේශන සේවා ආදායම | - | | 976,920.00 |
| | ජල පිය සටහන් ආදායම | 460,157.25 | | - |
| | පුහුණු සහ වැඩමුළු ආදායම | 294,500.00 | | |
| | විද්‍යාව මත පදනම් වූ ව්‍යාති | 404,750.00 | | |
| | ව්‍යාපෘති කලමනාකරණ ආදායම | 9,718,261.67 | | |
| | වෙනත් ආදායම් | 394,072.50 | | |
| | | 27,460,515.67 | | 14,030,203.36 |
| **2** | **<u>ව්‍යාපෘති සඳහා සෘජු වියදම</u>** | | | |
| | ව්‍යාපෘති වියදම් - කාබන් පිය සටහන් | 1,245,691.91 | | 150,000.00 |
| | ව්‍යාපෘති වියදම් -ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සඳහා වූ වියදම | 288,000.00 | | - |
| | ව්‍යාපෘති වියදම් - ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය | 291,575.17 | | - |
| | පුහුණු සහ වැඩමුළු සඳහා වූ වියදම් | 299,372.00 | | 92,222.00 |
| | ජල පිය සටහන වියදම් | 115,000.00 | | - |
| | විද්‍යාව මත පදන්ම් වූ ව්‍යාති සඳහා වියදම් | 15,000.00 | | - |
| | ව්‍යාති වියදම් | 1,378,569.00 | | 68,000.00 |
| | වන වගා ව්‍යාපෘති වියදම් | 510,000.00 | | |
| | | 4,143,208.08 | | 4,435,591.61 |
| | | | | |
| **3** | **<u>වෙනත් ආදායම්</u>** | | | |
| | පොලී ආදායම | 1,080,136.96 | | 832,397.26 |
| | | 1,080,136.96 | | 832,397.26 |
| | | | | |

| | | 2023 | | 2022 |
|---|---|---|---|---|
| | | රුපියල් | | රුපියල් |
| **4** | **පෞද්ගලික පිරිවැය** | | | |
| | කාර්ය මණ්ඩල වැටුප | 4,557,237.10 | | 3,909,360.12 |
| | වියදම් - සේවක අර්ථසාධක අරමුදල | 571,322.67 | | 481,800.00 |
| | වියදම් - සේවක භාරකාර අරමුදල | 143,359.62 | | 120,450.00 |
| | ජීවන වියදම | 850,451.61 | | 746,362.50 |
| | වැටුප් දීමනාව | 360,500.00 | | 454,109.92 |
| | වැඩබලන දීමනා | 420,260.18 | | - |
| | විශේෂ දීමනාව | 300,000.00 | | 300,000.00 |
| | පාරිතෝෂිකය වියදම් | 178,750.00 | | 144,280.82 |
| | දුරකථන දීමනා | 205,306.45 | | - |
| | වෙනත් දීමනා | 505,161.29 | | 373,437.50 |
| | වාහන දීමනා | 225,806.45 | | |
| | ඉන්ධන දීමනා | 232,523.87 | | - |
| | | 8,550,679.24 | | 6,529,800.86 |
| | | | | |
| | | | | |
| | | | | |
| **5** | **පරිපාලන වියදම්** | | | |
| | ලේකම් ගාස්තු | 134,108.10 | | - |
| | නීතිමය ගාස්තු | - | | 22,500.00 |
| | රක්ෂණ ගාස්තු | 72,539.70 | | 91,071.76 |
| | දුරකථන ගාස්තු | 124,991.97 | | 156,655.16 |
| | වෙබ් අඩවි සඳහා වූ වියදම් | 15,500.00 | | 25,000.00 |
| | තැපැල් සහ මුද්දර ගාස්තු | 6,735.00 | | 14,345.00 |
| | අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 127,500.00 | | 30,000.00 |
| | ඉන්ධන සහ වාහන නඩත්තු වියදම් | 307,470.00 | | 256,831.00 |
| | පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර නඩත්තු වියදම් | 112,125.00 | | 199,119.39 |
| | විගණන ගාස්තු | 182,160.00 | | 182,160.00 |
| | මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය වියදම් | 366,650.00 | | 55,424.00 |
| | ක්ෂයවීම් | 237,750.00 | | 80,414.06 |
| | ගමන් වියදම් | 19,235.92 | | 28,859.53 |
| | වෙනත් වියදම් | 18,275.00 | | 90,540.17 |
| | පරිවර්තන වියදම් | 33,111.87 | | 6,452.25 |
| | වෙළඳ දැන්වීම් වියදම් | 73,140.00 | | 72,688.00 |
| | විදේශ ගමන් වියදම් | 62,875.00 | | 24,000.00 |
| | කාර්ය මණ්ඩල සුබසාධනය | 7,225.75 | | 25,921.02 |
| | වාර්ශික ප්‍රතිලාභය | 13,375.70 | | - |

| | | 2023 | | 2022 |
|---|---|---|---|---|
| | | රුපියල් | | රුපියල් |
| | | | | |
| | **CSR** ක්‍රියාකරම් වියදම් | 17,100.00 | | - |
| | ජීවිත රක්ෂණය වියදම් | 215,644.00 | | - |
| | කාර්ය මණ්ඩල පුහුණුව වියදම් | 45,000.00 | | - |
| | විධායක මණ්ඩල වියදම් | 75,000.00 | | - |
| | විගණන කළමණාකරණ කමිටු දීමනා වියදම් | 75,000.00 | | - |
| | | | | |
| | | 2,342,513.01 | | 1,361,981.34 |
| | | | | |
| **6** | <u>විකුණුම් සහ බෙදාහැරීමේ වියදම්</u> | | | |
| | ප්‍රචාරණ වියදම් | 9,350.00 | | **-** |
| | | 9,350.00 | | |
| | | | | |
| **7** | <u>මූල්‍ය සහ වෙනත් වියදම්</u> | | | |
| | බැංකු ගාස්තු | 12,175.00 | | 5,155.00 |
| | | 12,175.00 | | 5,155.00 |
| | | | | |
| **8** | <u>ලැබිය යුතු දෑ</u> | | | |
| | ලැබිය යුතු ණයගැති ශේෂය | 15,214,503.44 | | 4,458,796.80 |
| | මුදල් අත්තිකාරම් | 2,612,771.00 | | 796,771.00 |
| | | 17,827,274.44 | | 5,255,567.80 |
| | | | | |
| **9** | <u>ස්ථාවර තැන්පතු</u> | | | |
| | ස්ථාවර තැන්පතුව ලංකා බැංකුව | 10,000,000.00 | | 10,000,000.00 |
| | | 10,000,000.00 | | 10,000,000.00 |
| | | | | |
| **10** | <u>මුදල් සහ මුදල් සමාන දෑ</u> | | | |
| | බැංකු ශේෂය | 550,957.73 | | 198,459.66 |
| | | 550,957.73 | | 198,459.66 |
| | | | | |

| | | 2023 | | 2022 |
|---|---|---|---|---|
| | | රුපියල් | | රුපියල් |
| | | | | |
| **11** | <u>ප්‍රකාශිත ප්‍රාග්ධනය</u> | | | |
| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | 25,000,010.00 | | 25,000,010.00 |
| | | 25,000,010.00 | | 25,000,010.00 |
| | | | | |
| **12** | <u>ගෙවිය යුතු දෑ</u> | | | |
| | ගෙවිය යුතු - සේවක අර්ථසාධක අරමුදල | 306,412.82 | | 983,028.01 |
| | ගෙවිය යුතු - සේවක භාරකාර අරමුදල | 125,561.76 | | 191,161.60 |
| | ගෙවිය යුතු විගණන ගාස්තුව | 367,160.00 | | 367,160.00 |
| | ගෙවිය යුතු උපයනවිට බදු | 10,542.00 | | 326,000.00 |
| | ගෙවිය යුතු පාරිතෝෂිකය | 1,228,030.82 | | 1,049,280.82 |
| | | 2,037,707.40 | | 2,916,630.43 |
| | | | | |
| **13** | <u>පෙර වසර ගැලපීම</u> | | | |
| | පාරිතෝෂිකය | - | | 740,000.00 |
| | විගණන ගාස්තුව | - | | (37,500.00) |
| | ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සඳහා වූ වියදම | 36,000.00 | | |
| | අධ්‍යක්ෂ මණ්ඩල වියදම් | 7,500.00 | | |
| | ලියුම් පෙට්ටිය වියදම් | 5,000.00 | | |
| | ඉන්ධන සහ වාහන නඩත්තු වියදම් | 18,500.00 | | |
| | සේවක භාරකාර අරමුදල | 2,025.00 | | |
| | රක්ෂණය | 38,755.54 | | |
| | | 107,780.54 | | 702,500.00 |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| **14** | **දේපළ පිරියත සහ උපකරණ** | | | |
| | | | | |
| **14.1** | **පිරිවැය / තක්සේරුව** | | | |
| | | 2023/01/01 දිනට ශේෂය | එකතු කිරීම් | 2023/12/31 දිනට ශේෂය |
| | | රුපියල් | රුපියල් | රුපියල් |
| | **කාර්යාල උපකරණ** | | | |
| | වායු සමීකරණ | 209,000.00 | | 209,000.00 |
| | | | | |
| | බයින්ඩින් යන්ත්‍රය | 7,000.00 | - | 7,000.00 |
| | | | | |
| | වෙනත් කාර්යාල උපකරණ | 55,000.00 | - | 55,000.00 |
| | | | | |
| | ගෘහ භාණ්ඩ සහ උපාංග | | | |
| | ගෘහ භාණ්ඩ සහ උපාංග | 525,635.00 | - | 525,635.00 |
| | | | | |
| | **වාහන** | | | |
| | මෝටර් රථය | 3,100,000.00 | - | 3,100,000.00 |
| | | | | |
| | මෝටර් බයිසිකලය | 199,640.00 | | 199,640.00 |
| | | | | |
| | **පරිගණක උපාංග** | | | |
| | පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර | 1,223,800.00 | 125,000.00 | 1,348,800.00 |
| | | | | |
| | **මුළු වත්කම්** | 5,320,075.00 | 125,000.00 | 5,445,075.00 |
| | | | | |
| 14.2 | **සමුච්චිත ක්ෂය** | | | |
| | | 2023/01/01 දිනට ශේෂය | ක්ෂය | 2023/12/31 දිනට ශේෂය |
| | | රුපියල් | රුපියල් | රුපියල් |
| | **කාර්යාල උපකරණ** | | | |
| | වායු සමීකරණ | 209,000.00 | - | 209,000.00 |
| | | | | |
| | බයින්ඩින් යන්ත්‍රය | 7,000.00 | - | 7,000.00 |
| | | | | |
| | වෙනත් කාර්යාල උපකරණ | 55,000.00 | - | 55,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| | **ගෘහ භාණ්ඩ සහ උපාංග** | | | |
| | ගෘහ භාණ්ඩ සහ උපාංග | 525,635.00 | - | 525,635.00 |
| | | | | |
| | **වාහන** | | | |
| | මෝටර් රථය | 3,100,000.00 | - | 3,100,000.00 |
| | | | | |
| | මෝටර් සයිකල් | 199,640.00 | - | 199,640.00 |
| | | | | |
| | **පරිගණක උපාංග** | | | |
| | පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර | 1,223,800.00 | 27,343.75 | 1,251,143.75 |
| | | | | |
| | **මුළු ක්ෂය වීම්** | 5,320,075.00 | 27,343.75 | 5,347,418.75 |
| | | | | |

# 07. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PSE/D/SLCF/02/23/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 දෙසැම්බර් 31 දින

සභාපති,
ශ්‍රී ලංකා දේශගුණ අරමුදල පුද්ගලික සමාගම.

**ශ්‍රී ලංකා දේශගුණ අරමුදල පුද්ගලික සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල පුද්ගලික සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

පිටුව 1 | 9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාගමේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වූ සේවා සැපයුම් සිදු කිරීමේදී පාරිභෝගිකයන් සමඟ ගිවිසුම්වලට එළඹ තිබූ අතර එම ගිවිසුම් අනුව ගිවිසුම්ගත ආදායමින් සියයට 40 ක් සංචලන අත්තිකාරම් (Mobilization Advance) ලෙසත් ඉතිරි සියයට 60 සේවා සහතික නිකුත් කිරීමේදීත් ගෙවිය යුතු බව සඳහන් කර තිබුණද සමාගම විසින් සේවා සැපයුම් ආදායම් හඳුනා ගැනීමේදී ගිවිසුමට එළඹෙන අවස්ථාවේද සම්පූර්ණ ආදායම හඳුනා ගන්නා බව නිරීක්ෂණය විය. ඒ අනුව 2023 වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර ඇති රු. 27,460,515 ක්වූ ආදායම්වල විචක්ෂණභාවය තහවුරු නොවුණි. මෙම ආදායමින් 2024 දෙසැම්බර් 09 දිනටද සේවය සපයා අවසන් නොකරන ලද ප්‍රමාණය රු.7,179,662ක් වී තිබුණි. ඒ අනුව ආදායම් හඳුනාගැනීමේදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතියේ අංක 23.14 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) සමාගම සතු පිරිවැය රු.5,320,075 ක් වූ දේපළ, පිරියත හා උපකරණ වල ඵලදායී ආයු කාලය අවසන් වී පැවතියද විගණිත වර්ෂය තුළදී ද එම වත්කම් භාවිතා කරනු ලබන බවට විගණනයේදී නිරීක්ෂණය විය. මේ අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත 17 කොටසේ ඡේද අංක 17.19 අනුව එම වත්කම් වල ඵලදායී ජීව කාලය නිවැරදිව ඇස්තමේන්තු ගත කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) 2021 ,2022 හා 2023 වර්ෂ වලට අදාලව සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ගෙවීම ප්‍රමාද වීම මත රු.507,700 ක අධිභාරයක් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායක මුදල් ගෙවීම ප්‍රමාද වීම මත 2021,2022 හා 2023 ජුනි මාසය දක්වා රු.64,804 ක අධිභාරයක් පනවා තිබුණද සමාගම විසින් එම අධිභාර මුදල් ගිණුම්ගත කිරීමට හා ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවල 7.8 කොටසට පටහැනිව සමාගම විසින් වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය තුළ ශුද්ධ ලාභය හෝ අලාභයට ගැලපීමේ දී මුදල් නොවන අයිතම ලෙස රු.178,750 ක් වූ පාරිතෝෂික වෙන්කිරීම් අගය ගලපා නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත 29.6 කොටස අනුව සමාගම විසින් ආදායම මත සමාලෝචිත වර්ෂයට අදාලව රු.4,112,708 ක බදු වියදමක් හඳුනාගත යුතු වුවද එකී බදු වගකීම මූල්‍ය ප්‍රකාශන තුළින් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු.1,080,137 ක පොළී ආදායම හඳුනාගැනීමේදී ඊට අදාල රඳවාගැනීමේ බදු මුදල වූ රු.56,849 ක මුදල වියදමක් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(උ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වන වගන්තිය ප්‍රකාරව, සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් ගණනය කිරීමේදී හා 1980 අංක 46 දරන සේවා නියුක්ත භාර අරමුදල් පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගණනය කිරීමේදී සේවකයාගේ මූලික වැටුප සහ අනුමත දීමනාද සැලකිල්ලට ගත යුතු වේ. එහෙත් සමාගම විසින් ආරම්භයේ සිටම සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් දායකත්වය ගණනය කිරීමේදී සේවකයාගේ මූලික වැටුප පමණක් සැලකිල්ලට ගෙන තිබුණු අතර ජීවන වියදම් දීමනාව, විශේෂ දීමනාව සහ දුරකථන දීමනාව යන දීමනා සැලකිල්ලට ගෙන නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා පමණක් අඩුවෙන් ගණනය කරන ලද සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් දායක මුදල් පිළිවෙලින් රු.270,566 ක් හා රු.40,268 ක් වී තිබුණි.

(ඌ) සමාගම විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති තුළ දක්වා ඇති පරිදි අඩමාණ ණය සහ බොල් ණය සඳහා සමාලෝචිත වර්ෂය තුළ වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ

පිටුව 5 | 9

විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ 1.2. (ඇ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනත | |
| (i) | 131 (1) වගන්තිය | සෑම සමාගමක් විසින්ම පනතෙහි පස්වන උපලේඛනයෙහි දක්වා ඇති සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය, සමාගම විසින් නිකුත් කර ඇති මුළු කොටස් සංඛ්‍යාව, අහිමි කල කොටස් සංඛ්‍යාව, සමාගම සංස්ථාගත කල දිනය හා කාර්යාලයේ ලිපිනය ආදී කරුණු ඇතුළත් වාර්ෂික වාර්තාවක්, යටත් පිරිසෙන් සෑම වර්ෂයකටම වරක් නියමිත ආකෘතියෙහි රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු වුවද සමාගම විසින් 2020 වර්ෂයෙන් පසු එබඳු වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | 223 (1) වගන්තිය | සෑම සමාගමක් විසින්ම එහි අධ්‍යක්ෂවරුන් හා ලේකම්වරුන්ගේ වර්තමාන නම් සහ පෙළපත් නම්, පදිංචි ස්ථානයේ ලිපිනයන් සහ වෘත්තිය ආදී තොරතුරු ඇතුළත් ලේඛනයක් එහි ලියාපදිංචි කාර්යාලයෙහි හෝ 116 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දෙනු ලබන වෙනත් යම් ස්ථානයක තැබිය යුතු වුවත් සමාගම එවැනි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

පිටුව 7 | 9

| | | |
|---|---|---|
| (ආ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 93 (1) වගන්තිය | සෑම තක්සේරු වර්ෂයක්ම අවසානවීමෙන් පසුව මාස 08 කට නොවැඩි කාලයක් තුළ එම තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාවක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගොනු කල යුතු වුවද සමාගම විසින් 2023 වර්ෂය සඳහා වන ආදායම් වාර්තාව 2024 ඔක්තෝබර් 10 දින වන විටත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගොනු කර නොතිබුණි. |
| (ඇ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2022 ජනවාරි 28 දිනැති හා අංක 02/2022 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව විධායක නොවන තනතුරු වලට අදාලව රු. 166,306 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ දුරකථන දීමනාව ලෙස ලබා දී තිබුණි. |
| (ඇ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛය | |
| (i) | මාර්ගෝපදේශ අංක 2.3 | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්ම සමඟ ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික අයවැය ලේඛනය රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මාර්ගෝපදේශ අංක 4.2. (h) | විගණන කමිටුව මාස 3 කට වරක්වත් පැවැත්විය යුතු බවට දක්වා තිබුණ ද 2023 වර්ෂයේදී විගණන කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි. |
| (iii) | මාර්ගෝපදේශ අංක 6.6 | කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා අවසන් ගිණුම් මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාගම විසින් සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම් නියමිත දිනට මාස 07 ක් ප්‍රමාද වී එනම් 2024 සැප්තැම්බර් 03 වන දින ඉදිරිපත් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (iv) | මෙහෙයුම් අත්පොත ඡේද අංක 2 | මෙහෙයුම් අත්පොතේ 2 ඡේදය ප්‍රකාරව සමාගම විසින් මෙහෙයුම් පද්ධති සහ පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර නොතිබුණි. |
| (v) | මෙහෙයුම් අත්පොත ඡේද අංක 7.3 | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූලික කාර්යසාධන දර්ශක (KPI) අනුමත ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය සමඟ කාලානුරූපීව සමාලෝචනය කර නොතිබුණි. |
| (vi) | මෙහෙයුම් අත්පොත ඡේද අංක 7.4 | සමාගමේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය, කාරක ප්‍රාග්ධනය, මුදල් ප්‍රවාහයන්, ද්‍රවශීලතා මට්ටම සහ ණය තත්ත්වයට (Debt Position) අදාල වාර්තාවන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාසිකව පරීක්ෂා කල යුතු වුවද සමාගම විසින් එම වාර්තා පිළියෙල කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

**2.3 වෙනත් කරුණු**

සමාගම විසින් රු.2,500,000 ක පිරිවැයකට අගය කර තිබූ පරිසර අමාත්‍යාංශයට අයත් කැබ් රථයක් 2012 වර්ෂයේ සිට භාවිතා කරනු ලැබුවද විගණිත දින දක්වාම එම කැබ්රථය සමාගම වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී. සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටුව 9 | 9